## ***ජාතික නිදහස් පෙරමුණේ නායක විමල් වීරවංශ මහතා***

## ***මාධ්‍යවේදීන් නැගූ ප්‍රශ්නවලට පිළිතුරු ලබාදුන් අයුරු…***

***ප්‍රශ්නය: ආණ්ඩු පක්ෂය 159ක් ඉන්නවා. එතකොට ඒ අංකවලින් ආණ්ඩුව අඩු කරන්න පුළුවන්යි කියලා හිතනවද?***

පිළිතුර: සාමාන්‍යයෙන් ගිනිකන්දක් කියන්නේ ලොකු කන්දක්. ඒ කන්ද ලාවා උතුරන්න කලින් කාටවත් හිතෙන්නේ නැහැ එහෙම දෙයක් වෙයි කියලා ඒ තරම් විශාල කන්දක. ඔය 159 කියන ඒවා දියවෙන්න යන්නේ බොහොම ටික වෙලාවයි. මහජන බලය ඉදිරිපිට ඕන බලයක් යටත් වෙන්න වෙනවා, වළක්වන්න බැහැ. ඉදිරි කාලය කියන්නේ මහජන බලය මහපාරේ ක්‍රියාත්මක වෙන කාලයක්. අඟුරු කුමාරට බලාගන්න පුළුවන් මේ ශාපයේ පාපයට විරුද්ධව නැගී සිටින මහජන විරෝධය මොන විදිහකටවත් ආපස්සට තල්ලු කරන්න හම්බවෙන්නේ නැහැ. ඒ මහජන විරෝධයට නායකත්වය දෙන්න අපි සූදානම්, ඒක වළක්වන්න මොන ජගතෙකුටවත් බැහැ.

***ප්‍රශ්නය: දැන් 159ක් අත ඉස්සුවානේ? මේ විශ්වාසය ඔවුන්ට ප්‍රකාශ කරේ ආණ්ඩුවවත් ඔහු (අමාත්‍යවරයා) වත් හොරෙක් නෙමෙයි කියන එකනේ?***

පිළිතුර: ඔව්.

***ප්‍රශ්නය: එතකොට ඔවුන් කියනවනේ මෙයා හොරෙක් නෙවෙයි, මෙයා වංචාවක් කරලා නැහැ කියලා. ඉතින් හොරෙක් නෙවෙයි නම්, වංචාවක් කරලා නැත්නම් ඉල්ලා අස් වෙන්න ඕනේ නැහැනේ? ඉල්ලා අස්වුණේ ඔබ හිතන්නේ ජනතාවගේ පීඩනයටද? නැත්නම් මේ ආණ්ඩුවේ විනිවිදභාවය පෙන්නන්නද?***

පිළිතුර: විනිවිදභාවය පෙන්නන්න නම් කරන්න තිබුණේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් හෝ අල්ලස් හෝ දූෂණ කොමිසමෙන් කෙලින්ම අධිකරණයට මේ චෝදනාව අරගෙන යන එකනේ. අධිකරණය මගපෙන්වීම යටතේ ඒ විමර්ශනය කරන එකනේ. චූදිතයාට රටින් පැන යන්න බැරි වෙන විදිහට පාස්පෝට් එක අධිකරණ භාරයට ගන්න එකනේ. අවශ්‍ය නම් රිමාන්ඩ් බන්ධනාගාරගත කරලා නඩු අහන එකනේ.

ඒක නොකර කොමිසම්, කොමිටි දාන්නේ මේ චූදිතයාව බේරගන්න මිසක් දඬුකඳේ ගහන්න නෙමෙයි. හැබැයි ඉතින් දැන් මහජන මතය මේකට විරුද්ධව ගොඩනැගිලා තියෙන හින්දා, ඉදිරියේ ලයිට්

කපනකොට මරාගෙන මැරෙන මානසිකත්වයකට මහජනයා එන්න නියමිත හින්දා, ඉදිරියේ විදුලි බිල අසාධාරණ ලෙස ලොකු අගයකින් ඉහළ දානකොට මේ රටේ ව්‍යාපාර වැහෙන හන්දා, කර්මාන්ත වැහෙන හන්දා, ඒ හැම මිනිහගෙම කේන්තිය ආණ්ඩුවට කිහිප ගුණයකින් එල්ල වෙන හන්දා ඒ ආතතියෙන් ගැලවීම සඳහා තමයි අර සෞම්‍යාට කියන්නේ, බාලකුමාරට කියන්නේ "ඔබ පොඩ්ඩක් පැත්තකට වෙලා හිටපන්, මෝරාව බිලි දෙන්නේ නැහැ, අවශ්‍ය කෙනා බිල්ලට දීලා අපි ඔබව බේරගන්නවා" කියලා.

***ප්‍රශ්නය: එදා හවස අමාත්‍යවරයා අයින් වෙච්ච දවසේ හවසම මාධ්‍යට ආපු ආණ්ඩු පක්ෂයේ ඇමතිවරු කිව්වේ "කිසිදු වරදක් වෙලා නැහැ, අපි හොරකම් කරන්නේ නැහැ, අපි විනිවිදභාවයෙන් පෙනී සිටින ආණ්ඩුවක්, කවදාකවත් හොරකමකට උඩගෙඩි දෙන්නේ නැහැ" කියලා?***

පිළිතුර: පට්ට හොරකමක් කරලා, ඒ පට්ට හොරකම අතේ පත්තු වෙලා, අර රෙද්දෙත් මොනවද වෙලා ඒ ඔක්කොම ගඳ ගහනකොට, ඒ ඔක්කොම ගඳ අරගෙන මාධ්‍ය ඉදිරියට ඇවිල්ලා පට්ට හොරකමේ අයිතිකාරයෝ ටිකක් කියනවා "කිසිම හොරකමක් වෙලා නැහැ" කියලා. ඉතින් අපිට පට්ට හිනා. මේ කියන ඒවා අහනකොට ඕවා හොඳයි කොණ්ඩේ බැඳපු චීන්නුන්ට. සිඟිති තුනේ අයට. සිඟිති තුනේ වුනොත් දැන් පිළිගන්නේ නැහැ.

එහෙන් මන්දිර පේනවා, මෙහෙන් හොරකම අතේ පත්තු වෙලා තියෙනවා, සිඟිති තුනේ උන්ටත් පේනවා. දැන් නායකයෝ යන්නේ ධම්මික (කැසිනෝ ධම්මික) ලාගේ මග. දැන් ඒගොල්ලෝ නායකයාගේ නායකයා කැසිනෝ ධම්මික. ජවිපෙ සාමාජිකයාගේ නායකයා අඟුරු කුමාර වුණා, අඟුරු කුමාරගේ නායකයා කැසිනෝ ධම්මික වුණා. ඉතින් දැන් සාමාජිකයෝත් ඔය පට්ටපල් බොරු පිළිගන්නේ නැහැ. පිළිගන්න තුන් දෙනෙක් ඇති, ඒ ඇරෙන්න රටේ මිනිස්සු ඔය ලුණු කන්නේ නැහැ. ඔය බොරු ඇහුවා ඉවරයි. ඒ බොරු වලට දැන් ආයේ අවනත නැහැ. ඔය බොරු වලින් සනසන්න බැහැ.

***ප්‍රශ්නය: කවදා හෝ සත්‍ය හෙළි වෙයි කියලා අමාත්‍යවරයාගේ ඉල්ලා අස්වීමේ ලිපියේ තියෙනවා?***

පිළිතුර: කවදා හෝ අඟුරු කුමාරත් දැනට තීරණය කර තිබෙන උද්‍යතය යටතේ සත්‍ය හෙළිවෙයි. ඒ සත්‍ය වනාහි "අමාත්‍යාංශ ලේකම් මීට සම්පූර්ණයෙන් වගකිව යුතුය, එබැවින් ඔහු මීට වරදකරුය" යන සත්‍යයයි. ඒ සත්‍ය හෙළි වූ පසු බාලකුමාර ඉබේ ගොඩයයි. ඒක දන්න හින්දා තමයි අර බාලකුමාර බය නැතුව කියන්නේ "කවදා හෝ සත්‍ය, නිර්මල, පරම පවිත්‍ර සත්‍යය මගේ මිතුරාවන අඟුරු කුමාර තෙමේ විසින් සොයා දෙයි" කියලා. ඒ විශ්වාසය එයාට තියෙනවා, එයා ඒකෙන් සතුටට පත්වෙලා ඉන්නවා. මෙහෙමනේ, බෙල්ල ගහලා යන්න ගිය මිනිහෙක්ව බෙල්ල බේරලා දෙන එකත් යාළුකමේ ලොකු දෙයක්නේ. ඒක ඉතින් මොනවා වුණත් හොඳ යාළුකමක්. ඒක පිළිබඳ විවාදයක් නැහැ.

***ප්‍රශ්නය: ඒ කියන්නේ මේ රජයේ නිලධාරීන්ව බිල්ලට දෙනවා කියන එකද?***

පිළිතුර: ඔය අමාත්‍යාංශ ලේකම්ට ඉල්ලා අස්වෙන්න කිව්වේ ඒ මහත්තයාව තමයි බෙල්ලට තොණ්ඩුව දාන්න හදන්නේ. ඒ මහත්තයාට පාන්දර හතරට ජනාධිපති කතා කරාද නැද්ද? කතා කර කර උපදෙස් දුන්නද නැද්ද? ඔය මිලදී ගැනීමේ ෂෙඩියුල් (Schedule) එක වෙනස් කරන්න ඇමතිට තනි අභිමතියට පුළුවන්ද?

දැන් මම රත්නායක කියනවනේ බ්ලැක් මාර්කට් (Black Market) එකෙන් හරි තෙල් ගන්න කැබිනට් අනුමැතිය හම්බුණා කියලා. බ්ලැක් මාර්කට්වලින් තෙල් ගන්න පුළුවන්ද ආණ්ඩුවකට? මේගොල්ලෝ හිතන් ඉන්නේ එහෙම. ඉතින් එහෙම කියන අය ඊට වඩා හොරකම් කරන්නේ නැහැ කියලා කොහොමද කියන්නේ? ලෝකේ වැඩිම මිලට ඩීසල් ගෙනාපු ආණ්ඩුවනේ. අඩු ගානේ ප්‍රීමියම් එක ඩොලර් 100කට වඩා තිබුණා, ඒකෙන් 150ක් විතර අඩු ගානේ හොර කප්පම වෙන්න ඕනා, කොමිස් වෙන්න ඕනා.

එතකොට බලන්න මෙහෙම පීඩාවකට වැටිලා තියෙන රටකින් මෙහෙම හොරා නඩයක් තමයි හොරු අල්ලන්න ආවේ. ඒ නිසා පැහැදිලිව පේනවා මේගොල්ලෝ බ්ලැක් මාර්කට් එකෙන්, කළු වෙළඳපොලිනුත් ගන්න පුළුවන් කැබිනට් තීරණ එහෙම ගත්තාලු. එහෙම තීරණ ගත්ත කැබිනට් එකකට අනාගතයේ හිරගෙදර ඇරෙන්න වෙන කොහොමවත් විවෘත නැහැ. සෙට් එකටම යන්න වෙනවා.

***ප්‍රශ්නය: මහජන උපයෝගිතා කොමිසම කියලා තියෙනවා ගල්අඟුරු නිසා වෙන පිරිවැය වැඩිවීමකට අපි ඉඩ දෙන්නේ නැහැ කියලා?***

පිළිතුර: දැන් මහජන උපයෝගිතා කොමිසම අපිට කියලා දෙන්නකෝ ගල්අඟුරු නිසා වැඩිවෙන කොටස කොච්චරද කියලා. එයා අපිට කියන්න එපැයි. ඔය බොරුවට ඔහොම කියලා හරියන්නේ නැහැ. ඔය කොමිසම කියන්න ඕනා ගල්අඟුරු වලින් වෙලා තියෙන විදුලිය ඒකකයට වෙලා තියෙන අතිරේක පිරිවැය මෙන්න මෙච්චරයි, අන්න ඒ ටික අපි ඇඩ් කරේ නැහැ කියලා.

අපි පිළිගන්නවා නැතුව ඉතින් ආණ්ඩුවෙන් දාපු සභාපතිලානේ ඉන්නේ, ආණ්ඩුවට එන චෝදනාව බේරගන්න ඒ විදිහට කියන්න පුළුවන්. ඒවා එච්චර බැරෑරුම්ව ගන්න තරම් මේ රටේ මිනිස්සු මෝඩයෝ නෙවෙයි. වැඩි කරන්නේ ගල්අඟුරු වංචාවේ බරත් පටවන්න තමයි. ගල්අඟුරු වංචාව වෙච්ච නිසා තමයි ඩීසල්වලින් විදුලිය උපදවන්න වුණේ. ඩීසල්වලින් විදුලිය උපදවපු නිසා තමයි පිරිවැය ඉහළ ගියේ. ජලාශ හිස් කරලා විදුලිය නිපදවන්න වුණේ ඒ හින්දා. ඒ හින්දා තමයි ගොවියට වතුර ටික නැති වෙන්නේ,

මහනුවර මිනිස්සුන්ට බොන්න වතුර ටික නැති වෙන්නේ. ඒ නිසා මේකේ පාඩුව ඔය කියන කොමිසමට තීරණය කරන්න බැහැ. මේක ඉතා විශාල පරාසයක් පුරා දිවෙන පාඩුවක්.

අර මේගොල්ලෝ පාඩුව කියලා කියන්නේ, ගෙනාපු ගල්අඟුරු වලින් අපි හිතමු එක ප්ලාන්ට් එකකින් 100ක් නිපදවන්න ඕනේ කියලා, දැන් නිපදවලා තියෙන්නේ 60යි, 40ක් අඩුයි. අන්න ඒ 40 තමයි පාඩුව කියලා කියන්නේ. ඒ පාඩුව එකතු කරන්නේ නැහැ කියලා කියන්නේ. අපි කියන්නේ ඒ පාඩුව පියවන්න ඩීසල් දැම්මා, ඒකෙන් තමයි පිරිවැය වැඩි වුණේ. අන්න අර අඩු වෙච්ච එකේ පාඩුව ගැනයි කියන්න ඕනේ. ඒක අදාල නැහැ, ඒක විතරක් නෙමෙයි පාඩුව.

***ප්‍රශ්නය: ඇත්තටම ගොවියට වතුර නැතිවීමත් මේකට අදාලද?***

පිළිතුර: ඉතින් ඔය වික්ටෝරියා ජලාශය පහුගිය කාලේ හිස් කරේ මේ ජල විදුලිය නිපදවන්නනේ.

***ප්‍රශ්නය: ඒක එකතු කරන්න බැරි වෙන්නේ ඇයි?***

පිළිතුර: ඇයි බැරි වෙන්නේ? ඒ ජලාශවලින් නෙමෙයිද අපේ කුඹුරු අමුණුවලට වතුර ටික එන්නේ?

***ප්‍රශ්නය: මම කිව්වේ ලයිට් බිල වැඩි වෙද්දී ගොවියට වෙච්ච පාඩුව ගණනය වෙන්නේ නැහැනේ?***

පිළිතුර: වෙන්නේ නැහැ, වෙන්නේ නැහැ. ඒ නිසා ඔය කොමිසමට ඔය මොකක් දැම්මත් අපිට පිළිගන්න බැහැ.

***ප්‍රශ්නය: මේ විදුලි උත්පාදනයට සම්බන්ධ අමාත්‍යවරයා එක්ක හිටපු ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාකාරී සාමාජිකයෙක් ඔහුගේ වත්කම් ගැන මේ දවස්වල කතාවක් යනවා දැක්කා නේද? මොකද හිතෙන්නේ?***

පිළිතුර: මට හිතෙන දේවල් ඔක්කොම කියන්න බැහැ, ඒ තරම් දේවල් හිතෙනවා. එතුමා දැනට මාස කිහිපයකට කලින් දුකනේ විකුණුවේ. නෝනාට හම්බවෙන්නේ මෙච්චරයි, දැන් කන්නත් නැහැ, බොන්නත් නැහැ, නාන්න වතුරත් නැහැ කියන සයිස් එකේ කතා කරේ. ඉතින් එහෙම කතා කරපු මිනිහට එකපාරට කප්පරක් දේපල තියෙන බවක් පේනවා. අම්මයි තාත්තයි මැරුණට පස්සේ එකපාරට ස්වීප්

එකක් ඇඳුනයි කියනවා. ඒ අතරේ කියනවා අම්මා බලන්න මේ අවුරුද්දට නුවර ගියා කියලත්, මම දන්නේ නැහැ ඒ අය අම්මා කෙනෙක්ද කියලා.

කොහොම වුණත් ඉතින් හත්පොලේ ගාගෙන තියෙන්නේ. මම දන්නවා ඇතුළත කතාව බොහොම ගැඹුරට, නමුත් මම කැමති නැහැ ඒවා මේ විදිහට මාධ්‍ය ඉස්සරහා කතා කරන්න. ඒ ගැන තොරතුරු නිත්‍යානුකූල විමර්ශනයක් එන දවසකට අපිට පුළුවන් ඒ ගැන කතා කරන්න.

***ප්‍රශ්නය: ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයෝ ජීවත් වෙන්නේ පරිත්‍යාගවලින්නේ? කවුරුහරි දෙනවා ඇති?***

පිළිතුර: පුළුවන් පුළුවන්. මොළේ ලොකු අමාරුවක් තියෙන කවුරු හරි හිටියොත් දෙයි. මම දන්නේ නැහැ එහෙම ඉන්න පුළුවන්. නමුත් මේ කියන්නේ පරිත්‍යාගයක් නෙමෙයි. පරිත්‍යාගවලට විහිළු කරන්න එපා. හොඳයි, බොහොම ස්තූතියි.